සියළුම හිමිකම් ඇවිරිණි]
*All Rights Reserved ]*

# පාසල් වලට සිසුන් තොරා ගැනීමට සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා පැවැත්වෙන විභාගය

**I පත්‍රය**

**නැණ ලොවට පා තබන හපනුන්ට මඟ කියන**
**"අදිති"**

5

පැය 01 යි

විභාග අංකය ...............................

**<u>විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්</u>**


- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40 ක් ඇත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පරිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි.<br>අවසාන ලකුණ නිවැරදිය. | V/I/S/CH |

**01. පහත දී ඇති අංක 1 සහ 2 ප්‍රශ්නවල හිස් කොටුවලට ගැළපෙන රූපය තෝරන්න.**

01.





i.




ii.



iii.

02.





i.




ii.



iii.

03. මෙහි ඇති රූප A මත B, B මත C වන ලෙස එකමතඑක තැබුවහොත් නිර්මාණය වන රූපය තෝරන්න.




i.



ii.



iii.



- **අංක 4 සහ 5 ප්‍රශ්නවල කොටුව තුළ ඇති කාණ්ඩයට ඇතුළත් කිරීමට වඩාත් ගැළපෙන රූපය තෝරන්න.**

04.




i.



ii.



iii.



05.

i.  ii.  iii. 

- **පහත දී ඇත්තේ රු 2 කාසි, රු 5 කාසි, රු 10 කාසි වෙන වෙන ම දැමූ පෙට්ටි 03 කි. ඒ අනුව 6 සහ 7 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| **රු 2** | **රු 5** | **රු 10** |
|---|---|---|


06. ඉහත පෙට්ටි 3 න් ම අවම එක කාසිය බැගින් හෝ ගෙන කාසි 10 කින් සාදාගත හැකි මුදලේ වැඩිම අගය විය හැක්කේ,

i. රු 87.00 ii. රු 100.00 iii. රු 20.00

07. සනිජ රු.2 කාසි ඇති පෙට්ටියෙන් කාසි 3 ක් ද, රු.5 කාසි ඇති පෙට්ටියෙන් 2 කාසි මෙන් දෙගුණයක් ද, රු.10 ක් ඇති පෙට්ටියෙන් 2 කාසි මෙන් කාසි තුන් ගුණයක් ද, ගෙන කැටයකට දමයි. කැටයේ තිබිය හැකි මුදල වන්නේ,

i. රු 126.00 ii. රු 156.00 iii. රු 96.00

08. පහත ඇති රූපයේ හඳුනා ගත හැකි චතුරස්‍ර ගණන කීය ද?



i. 6 ii. 7 iii. 8

09. පහත කවියෙන් විස්තර වන්නේ කවුරු ගැන ද?

*බඩගිනිවෙලා මා ගිය කළ පුතුගේ ගෙට*
*මැනලා වී දෙකක් දුන්නයි මල්ල කට*
*ගන්දෝ නොගන්දෝ කියලා සිතුනි මට*
*මැනල ද පුතේ කිරි දුන්නේ මා නුඹට*

i. සතුටින් සිටින මවක් ගැන

ii. දුකින් සිටින මවක් ගැන

iii. දුකින් සිටින පියෙක් ගැන

10. දී ඇති වාක්‍යයේ ඇලපිල්ල යෙදී ඇති එකිනෙකට වෙනස් අකුරු කීයක් තිබේ ද?

**අපේ මාමා මාතර ගිහින් ගෙනා ආස්මි**
**මම ඉතාම ආසාවෙන් කෑවා.**

i. 7 ii. 9 iii. 5

- 11 සහ 12 ප්‍රශ්නවලට සුදුසු වචනය තෝරන්න.

11. **ක්‍රීඩකයා ඉතා උනන්දුවෙන් ක්‍රීඩා කරයි → ශිෂ්‍යයා ඕනෑකමින් පාඩම් කරයි.**

ක්‍රීඩකයා→ ශිෂ්‍යයා නම් - උනන්දුවෙන් → ....................................

i. ක්‍රීඩා ii. ඉතා iii. ඕනෑකමින්


12. **යහපත් මිනිස්සු රෝගීන්ට පිහිට වෙති → අසරණ ළමයි කෑම ඉල්ලා අඬති.**

මිනිස්සු → ළමයි නම් - යහපත් → ................................

i. කෑම ii. අඬති iii. අසරණ


- ප්‍රශ්න අංක 13 සහ 14 රටා හඳුනාගෙන හිස්තැනට සුදුසු පිළිතුර තෝරන්න.

13.




i. 4 ii. 7 iii. 2

14.




i. 42 ii. 72 iii. 32

15. පහත දැක්වෙන ඡේදයේ හිස්තැනට ගැළපෙන වචන ඇතුළත් කොටස් තෝරන්න.

වන ......................................... නිසා ප්‍රධාන වශයෙන් ජල උල්පත් .................................. , පිරිසිදු වාතය නොලැබීමත් සිදුවේ.

එමෙන් ම ..........................සේදී යාම නිසා අපේ පරිසරය විනාශයට ලක් වේ.

i. **ගහණය / ආරක්ෂා වීමත් / ජලය**

ii. **විනාශය / සිඳීයාමත් / පස**

iii. **සිව්පාවුන් / පිළියමක් / කුඹුර**

16. බිත්ති ඔරලෝසුවක් බිම වැටී කැබලි දෙකකට වෙන් විය. එහි එක කොටසක වූ ඉලක්කම්වල එකතුව 42 විය. ඉතිරි කැබැල්ලේ ඇති ඉලක්කම් ගණන කීය ද?

i. 8 ii. 36 iii. 12

17. ඕනෑම එක ළඟ ඇති සංඛ්‍යා 03 ක් එකතු කළ විට ලැබෙන අගය

i. ඉරට්ටේ සංඛ්‍යාවකි.

ii. ඔත්තේ සංඛ්‍යාවකි.

iii. ඔත්තේ මෙන්ම ඉරට්ටේ විය හැක.

18. සහන්, තෙනුජ, ජිනුත් සහ බිනුක යන ළමයින්ගෙන් ළමයින් දෙදෙනා බැගින් කාණ්ඩායම් කිරීමට ගුරුතුමියට අවශ්‍ය විය. ඒ සදහා ඇයට විකල්ප අවස්ථා කීයක් තිබේ ද?

i. 9 ii. 6 iii. 3

19.

| | | |
|---|---|---|
| **1** | **2** | **3** |
| **4** | **5** | **6** |
| **7** | **8** | **9** |

මෙහි දැක්වෙන ඩිජිටල් අංක සහිත පුවරුවකි. එහි මිනිත්තුවෙන් මිනිත්තුවට පළමුවන පේළිය තුන්වන පේළියටත්, තුන් වන පේළිය දෙවන පේළියටත්, දෙවන පේළිය පළමු පේළියටත් වන පරිදි හුවමාරු වේ. මේ ආකාරයට මිනිත්තු 4 ක් ගිය පසු හරි මැද කොටුවට ඉහළින් සහ පහළින් ඇති ඉලක්කම් දෙක වන්නේ,


i. 1 -7 ii. 2 -8 iii. 3 -9

20. මෙහි ඇති අකුරු A සිට F දක්වා පිළිවෙළට සැකසීම සඳහා අකුරු කීයක පිහිටීම වෙනස් කළ යුතු ද?

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| A | C | G | D | E | B | F |

i. 4 ii. 3 iii. 5

21. පැත්තක දිග 5cm වන සමචතුරස්‍රාකාර හැඩති මුහුණත් ඇති ගණකයක් වටා රබර් පටියක් යොදා ඇත. එය යෙදීමේ දී රබර් පටියේ මුල් දිග මෙන් පස් ගුණයක් ඇදී ඇත. රබර් පටියේ මුල් දිග කොපමණ විය හැකි ද?



i. 25cm

ii. 4cm

iii. 12.5cm

22. පසුගිය දිනවල පැවති අධික වර්ෂාව නිසා දිස්ත්‍රික්ක ගණනාවකට නාය යෑමේ රතු නිවේදන නිකුත් කරන ලදී. එයට ඇතුළත් විය හැකි දිස්ත්‍රික්ක දෙකකි.

i. අනුරාධපුර, රත්නපුර

ii. රත්නපුර, නුවරඑළිය

iii. පොළොන්නරුව, නුවරඑළිය


23. අගය අඩුවන පිළිවෙළට සකස් කර ඇති පිළිතුර තෝරන්න.

i. දහය, විස්ස, පනහ, සියය

ii. පන්දහස, දහස, පන්සීය, සියය

iii පනහ, සියය, පන්සීය, පන්දහස

24. පහත දී ඇති ත්‍රිකෝණයේ රේඛා දිගේ කැපීමෙන් වෙන් කරගත හැකි උපරිම ත්‍රිකෝණ ගණන කීය ද?



i. 15

ii. 10

iii. 5

25. ගමනකින් $\frac{4}{8}$ ක් පාපැදියේ ගිය එසඳ ඉතිරි ප්‍රමාණයෙන් $\frac{4}{8}$ ක් බසයෙන් ගියේ ය. ඉතිරි වූ දුර ප්‍රමාණය යතුරු පැදියෙන් ගියේ ය. යතුරු පැදියෙන් ගිය දුර 2km නම් ගමනේ මුළු දුර සොයන්න.

i. 16km ii. 4km iii. 8km

26. ළමුන් දෙදෙනෙකුගේ ප්‍රකාශ දෙකක් පහත දැක් වේ.

සඳුන් → රු 1000 ට අඩු රු 500 ට වැඩි විශාල ම මුදල මගේ ළඟ තියෙනවා

කසුන් → රු 500 ට වැඩි රු.1000 ට අඩු අඩු ම මුදල මගේ ළඟ තියෙනවා

මේ අනුව ඔවුන් දෙදෙනා ළඟ ම තිබිය හැකි මුදල වන්නේ,

i. රු 1500.00 ii. රු 1499.00 iii. රු 999.00


27. මාර්තු මාසයේ දින සඳහන් දින දර්ශනයක එකේ ඉලක්කම් කීයක් දැක ගත හැකි ද?

i. 14 ii. 13 iii. 15

28. එක්තරා ගොවි මහතෙක් තමාගේ ගොවිපලේ සිටින සතුන් ගැන මෙසේ ප්‍රකාශ කළේ ය. හතර දෙනෙක් හැර ඉතිරි සියලු සතුන් ඌරන්ය. හතර දෙනෙක් හැර ඉතිරි සියලු සතුන් ගවයන් ය. හතර දෙනෙක් හැර ඉතිරි සියලු සතුන් එළුවන්ය. මේ ගොවිපලේ සිටින මුළු සතුන් ගණන කොපමණද?

i. 6 ii. 12 iii. 8

29. දී ඇති වෘත්තාකාර ධාවන පථයේ A නම් ස්ථානයේ සිට ඉන්සිත් B දෙසටත් සදෙව් D දෙසටත් දිවීම ආරම්භ කරයි. ඉන්සිත්ගේ වේගය සදෙව්ගේ වේගය මෙන් තුන් ගුණයක් නම්, ඔවුන් දෙදෙනා නැවත මුණගැසෙන ස්ථානය කුමක් ද?




i. A

ii. D

iii. C

30. පා පැදි ධාවන තරගයක යෙදී සිටි තරගකරුවෝ හත් දෙනෙක් තරගය නිමා කර තිබුණේ පහත පරිදි ය.

A - සුනිල්ට පෙර තරගකරුවෝ 5 දෙනෙක් නිම කරන ලදී.

B - වැඩිම කාලයක් වාර්තා කර තිබුණේ කමල් ය.

C - කසුන්ට වඩා තත්පර 30 ක් ප්‍රමාද වූ දසුන් තරගයේ දෙවෙනියා විය.

මෙම තොරතුරුවලට අනුව තරගයේ පළමුවෙනියා හා හයවෙනියා හඳුනා ගැනීමට

i. හැකි ය. ii. නොහැකි ය iii. කරුණු ප්‍රමාණවත් නැත

31. නිවැරදි පෙළගැස්ම හඳුනා ගන්න.

i. අවතැන් වීම, ගංවතුර වැස්ස, සහනාධාර

ii. වැස්ස, ගංවතුර, අවතැන් වීම, සහනාධාර

iii. සහනාධාර, ගංවතුර, වැස්ස, අවතැන්වීම

32. ක්‍රිකට් තරගයක දී හතරේ සහ හයේ පහරවලින් පමණක් අර්ධ ශතකය ලබා ගත් ක්‍රීඩකයෙකු ඒ සඳහා මුහුණ දුන්නේ පන්දු 9 ක් සඳහා පමණි. එල්ල කරන ලද හතරේ හා හයේ පහර ගණන විය හැක්කේ,

i. හතරේ 3 හයේ 6 යි ii. හතරේ 2 හයේ 7 යි iii. හතරේ 4 හයේ 5 යි

33. පහත කවියේ පද පේළි නිවැරදි ව ගළපා ඇති පිළිතුර තෝරන්න.

A - පාන්දරම එහෙන් මෙහෙන්

B - ඇසෙහි කුරුලු ගීතේ

C - පුංචි අපට සිරි සැප දෙයි

D - සිරි ලංකා දීපේ.

i. ABDC ii. DCAB iii. CDAB

34. පහත වාක්‍ය අතරින් නිවැරදි ව පද ගළපා ඇති වාක්‍ය තෝරන්න.

i. කුරුල්ලා කෑම සොයා පියාඹයි.

ii. කුරුල්ලා පියාඹයි කෑම සොයා.

iii. කෑම සොයා කුරුල්ලා පියාඹයි.

35. ජානු පින්තූරයක් දෙස බලාගෙන මෙසේ කියයි. මෙහි සිටින තැනැත්තියගේ මව, මගේ මවගේ, මවගේ එකම දියණිය වෙයි. මේ අනුව අත ඇති පින්තූරය,

i. ජානුගේ මවගේ ය. ii. ජානුගේ ය. iii. ජානුගේ ආච්චිගේ ය.

36. කැඩපතකින් දර්ශනය වීමේ දී ඒ ආකාරයෙන් ම පෙනෙන ඉංග්‍රීසි කැපිටල් හෝඩියේ අකුරු ගණන වන්නේ,

i. 11 ii. 8 iii. 9

37. පසුගිය කාලයේ ලෝකය පුරා ව්‍යාප්ත වූ වසංගතයක් ලෙස කොවිඩ් 19 නම් කළ හැක. ශ්‍රී ලංකාවේ මෙම රෝගීන් වාර්තා වීමත් සමඟ පාසල් වසා දැමීමට සිදුවිය. එයට ප්‍රධාන ලෙසම බලපාන්නට ඇත්තේ,

i. නිරෝධායන කටයුතුවලට පාසල් අවශ්‍ය නිසා
ii. කෝවිඩ් රෝගය ළමයින් ඉක්මණින් ගොදුරු වූ නිසා
iii. පහසුකම් ප්‍රමාණවත් නොවූ නිසා

- **38 හා 39 ප්‍රශ්නවලට කවිය ඇසුරින් පිළිතුරු තෝරන්න.**

***තබා තිබෙන පිළිවෙළිනා***
***කිසියම් බඩුවක් සොබනා***
***අහකට ගත්තොත් එයිනා***
***නැවත තබනු තිබූ ලෙසිනා***


38. මෙයින් කියවෙන්නේ, .....

i. පිළිවෙළකට තබා ඇති බඩු ඉවතට නොගන්නා ලෙස ය.
ii. පිළිවෙළකට තබා ඇති බඩු ඉවතට ගත් විට නැවත එලෙස ම තැබීම.
iii. නිතර භාවිතා කරන දේවල් පිළිවෙළකට තැබීම අනවශ්‍ය බව.

39. ''අපිළිවෙළ යන්නට විරුද්ධාර්ථයක් දක්නට ලැබෙන කවි පද පේළිය වන්නේ,

i. පළමු පේළියයි
ii. දෙවන පේළියයි
iii. සතරවන පේළියයි

40. ඊතලය ඇති පැත්තට ලොකු රෝදය කරකැවේ. එවිට.




i. A හා B ඉහළට එස වේ.
ii. A ඉහළට යන අතර B පහළට ගමන් කරයි.
iii. A පහළට යන අතර B ඉහළට ගමන් කරයි.